දුරකථන ) 0112669192 ,0112675011
தொலைபேசி 0112698507 , 0112694033
Telephone ) 0112675449 ,0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம்

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) CF/EXI/12/2024
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி )2024/09/04
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

**පොදු චක්‍රලේඛ ලිපි අංක : 02-129/2024**

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ජාතික රෝහල, කොළඹ

අධ්‍යක්ෂ - ජාතික රෝහල, මහනුවර

රේඛීය අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්,

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

අදාල ආයතන ප්‍රධානීන් වෙත.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ (MT - 05) වැටුප් පරිමාණයේ අතුරු වෛද්‍ය සේවයට අදාල පවුල් සෞඛ්‍ය සේවාවේ II "අ" ඛණ්ඩයේ/ II ශ්‍රේණියේ නිලධාරිනීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2024**

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී II "අ" ඛණ්ඩයේ / II ශ්‍රේණියේ නිලධාරිනීන් II "අ" ඛණ්ඩයට / II ශ්‍රේණියට උසස් වී වසර 03ක් ගතවීමට පෙර සමත් වියයුතු කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2024/10/26 සහ 27 යන දිනයන්හි දී සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

**02. සුදුසුකම්**

මෙම විභාගයට අයදුම් කළ යුත්තේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී / II "අ" ඛණ්ඩයට / II ශ්‍රේණියට පත්වීම් ලද, හා මෙතෙක් එම විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරිනීන්ට පමණි.

**සැ.යු :- අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2024/09/20 දින වන විට II ශ්‍රේණියට පත්කර, අදාල පත්වීම් ලිපිය ලබා ඇති** නිලධාරිනීන්ගේ **අයදුම්පත් පමණක් මා වෙත එවීමට කටයුතු කරන්න.** (II ශ්‍රේණියට පත් කරන ලද ලිපියේ සහතික කරන ලද පිටපතක් අයදුම්පත්‍රය සමඟ අමුණා එවීම අනිවාර්ය වේ.)

**03. අයදුම්පත්**

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරු විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385, "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (විභාග) වෙත **2024/09/20** දින හෝ ඊට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එම ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවර **"පවුල් සෞඛ්‍ය සේවාවේ II "අ" ඛණ්ඩයේ / II ශ්‍රේණියේ නිලධාරිනීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2024"** ලෙස සඳහන් කළයුතුය. **මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පෞද්ගලික ලිපිගොනු භාර නිලධාරියා විසින්ද, සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින්ද සහතික කර තිබීම අනිවාර්ය වේ.** තම අයදුම්පත සමග රාජකාරී ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු.110.00 ක් වටිනා මුද්දර ඇලවූ "9×4" ප්‍රමාණයේ ලියුම් කවර 02ක් ද එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැ.යු. :- ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව අයදුම්පත්‍රය $A_4$ කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 09 දක්වාත් සකස් කළයුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

04. විභාග ගාස්තු

I. විභාගයට පළමු වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවලංගු නොකල මුද්දර අයදුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළයුතුය.

II. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

05. විභාගයට ඇතුලත් කර ගැනීම.

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂිකාවන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණකර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුලදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාව තහවුරු කල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළයුතුය.

(අ) ජාතික හැඳුනුම්පත

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාළ ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය

(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

06. විභාග පටිපාටිය -

මෙම විභාගය දෙපාර්තමේන්තු පරීක්ෂණය සහ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය යනුවෙන් කොටස් දෙකකි. දෙපාර්තමේන්තු පරීක්ෂණය, ලිඛිත, වාචික සහ ප්‍රායෝගික වශයෙන් කොටස් තුනකින් යුක්ත වන අතර, එක් එක් කොටස සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා සෑම කොටසකට අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය.

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි යනුවෙන්ද විෂයන් දෙකකින් සමන්විත වන අතර විෂයන් දෙකටම ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා සෑම විෂයකටම අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය.

එක්වරකදී හෝ කිහිපවරකදී විෂයන් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. පළමුවරට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සියලුම විෂයයන් අයදුම් කළයුතුය.

07. විෂය නිර්දේශ මාලාව

07.1 දෙපාර්තමේන්තු පරීක්ෂණය

07.1.1 විෂයානුබද්ධ ලිඛිත පරීක්ෂණය

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය (03) තුනකි. රචනා මාදිලියේ ප්‍රශ්න (08) අටකින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුයි.

විෂය නිර්දේශය

i. මාතෘ සංරක්ෂණය
ii. ළදරු ළමා සංරක්ෂණය
iii. පෝෂණය
iv. ප්‍රතිශක්තිකරණය
v. පවුල් සංවිධානය
vi. සෞඛ්‍ය අධ්‍යාපනය
vii. ළමා මානසික සෞඛ්‍ය
viii. දන්ත සෞඛ්‍ය
ix. බෝවන රෝග
x. සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා වැඩ තක්සේරු කිරීම

**07.1.2 විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණය** - විෂයානුබද්ධ ලිඛිත ප්‍රශ්න පත්‍රයට අදාල විෂය ක්ෂේත්‍රය ඇසුරින් ප්‍රායෝගිකව කරනු ලබන පරීක්ෂණයකි. කාලය පරීක්ෂණය අනුව වෙනස් වේ.

**07.1.3 විෂයානුබද්ධ වාචික පරීක්ෂණය** - විෂයානුබද්ධ ලිඛිත ප්‍රශ්න පත්‍රයට අදාල විෂය ක්ෂේත්‍රය ඇසුරින් සහ රාජකාරියේදී මුහුණපාන ගැටළු පිළිබඳව වාචිකව කරනු ලබන පරීක්ෂණයකි. කාලය විනාඩි 15 කි.

**07.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

**07.2.1 ආයතන සංග්‍රහය**

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය (03) තුනකි. රචනා මාදිලියේ ප්‍රශ්න (07) හතකින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සැපයිය යුතුයි.

❖ **ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ.**

| | | |
|---|---|---|
| XV වන පරිච්ඡේදය | - | අධ්‍යයන, අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යාම. |
| XVI වන පරිච්ඡේදය | - | නිවාඩු ගමන් |
| XXIII වන පරිච්ඡේදය | - | ඇතැම් වර්ග වල රෝගවලින් පෙලෙන රජයේ නිලධාරීන්ට විශේෂ අනුග්‍රහය හා ඒ පිළිබඳ කොන්දේසි |
| XXIV වන පරිච්ඡේදය | - | වැටුප් ණය සහ අත්තිකාරම් |
| XXV වන පරිච්ඡේදය | - | වෘත්තීය සංගම්වල සාමාජිකයින්ට අනුග්‍රහය. |
| XXVII වන පරිච්ඡේදය | - | ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග. |
| XXVIII වන පරිච්ඡේදය | - | පරිපාලන කාර්ය පරිපාටි සහ විධි |
| XXX වන පරිච්ඡේදය | - | රාජ්‍ය නිලධාරීන් සම්බන්ධව ආණ්ඩුව සතු බලතල. |
| XXXIII වන පරිච්ඡේදය | - | නීති උපදෙස් සහ නීති ක්‍රියාමාර්ග. |
| XLVII වන පරිච්ඡේදය | - | සාමාන්‍ය හැසිරීම සහ විනය |
| XLVIII වන පරිච්ඡේදය | - | විනය කාර්ය පරිපාටිය පිළිබඳ රීති. |

**07.2.2 මුදල් රෙගුලාසි**

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය (03) තුනකි. රචනා මාදිලියේ ප්‍රශ්න (07) හතකින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සැපයිය යුතුයි. මුළු ලකුණු 100කි.

**මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ.**

VI වන පරිච්ඡේදය - ආණ්ඩුවේ මුදල් යනාදියෙහි භාරකාරත්වය, අග්‍රිමය සහ බැංකු ගිණුම්, රාජ්‍ය මුල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව බැංකු ගිණුම්.
(මු. රෙ. 315 සිට මු. රෙ. 396 දක්වා)

XIII වන පරිච්ඡේදය - සැපයීම් වැඩ සහ සේවා :- සැපයීම්/ මිලට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණය, ,ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරවීම
(මු. රෙ. 708 සිට මු. 5රෙ. 775 දක්වා)

08. **විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම**

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ පිළිතුරු පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ බලා ගෙන පිළිතුරු ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ පිළිතුරු පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

09. **කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ නියුතු අදාල නිලධාරීනීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේද ඇතුලත් කර ඇත.**

**Web Path :- www.health.gov.lk ⟶ Staff Access ⟶ Administration ⟶ Examination ⟶ Circulars**

**ස.යු. මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත් වේ.**

වාමික එච් ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට

වාමිකා එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

**EXI**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ (MT - 05) වැටුප් පරිමාණයේ අතුරු වෛද්‍ය සේවයට අදාල පවුල් සෞඛ්‍ය සේවාවේ II "අ" ඛණ්ඩයේ / II ශ්‍රේණියේ නිලධාරිනින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2024**

01. (අ) I. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) - ..........................................................................................

..........................................................................................

II. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | |

III. මුලකුරු සමඟ නම (සිංහලෙන්)- ..........................................................................................

..........................................................................................

IV. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | |

(ආ) I. II "අ" ඛණ්ඩයට / II ශ්‍රේණියට උසස්කළ දිනය - ..........................................

ලිපි අංකය - ..........................................

(II ශ්‍රේණියට පත් කරන ලද ලිපියේ සහතික කරන ලද පිටපතක් අයදුම්පත්‍රයට අමුණන්න.)

II දැනට ලබන වාර්ෂික වැටුප - ..........................................................................................

III. ජාතික හැඳුනුම්පත් අංකය -

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

IV. ජංගම දුරකථන අංකය -

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

V. විද්‍යුත් ලිපිනය - ..........................................................................................

02. ඔබ මෙවර පෙනිසිටීමට බලාපොරොත්තු වන විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුල (√) ලකුණ යොදන්න. පෙනි නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

| | | | |
|---|---|---|---|
| විෂයානුබද්ධ ලිඛිත පරීක්ෂණය | ☐ | විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණය | ☐ |
| ආයතන සංග්‍රහය | ☐ | විෂයානුබද්ධ වාචික පරීක්ෂණය | ☐ |
| මුදල් රෙගුලාසි | ☐ | | |

03. (අ) දැනට සේවය කරන ආයතනය :- සිංහලෙන් ..........................................................................................

ඉංග්‍රීසියෙන් ..........................................................................................

(ආ) මෙම ආයතනය අයත් වන්නේ :- රේඛීය අමාත්‍යාංශයට ☐ පළාත් සභාවට ☐

(ඇ) පළාත් සභාවට නම් අදාල පළාත :- ..........................................................................................

(ඈ) එය අයත් දිස්ත්‍රික්කය - ..........................................................................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද "9×4" ප්‍රමාණයේ රු 110.00 ක මුද්දර ඇලවූ ලියුම් කවර 02ක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද? ..........................................

(ඊ )1. තැපැල් ලිපිනය (සිංහලෙන් හෝ දෙමළෙන්) - ..........................................................................................

..........................................................................................

2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ..........................................................................................

..........................................................................................

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) - ..........................................................................................

05. (අ) මීට ප්‍රථම වරට මෙම විභාගයට පෙනී සිටියේද? ..........................................................................................

(ආ) මෙම විභාගයට ඉල්ලුම් කරන්නේ ප්‍රථම වරට නොවේනම් මුද්දර අලවා තිබේද?

| |
|---|
| මුද්දර කොටුව |

06. **අයදුම්කරුගේ සහතිකය**

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(I) මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වරට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / ප්‍රථම වරට නොවන බැවින් රු.....................ක් වටිනා මුද්දර අලවා ඇති බවත්* මෙම අයදුම්පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකග වන බවත් මෙයින් සහතික කරමි.

..............................
දිනය .......................................... අයදුම්කරුගේ අත්සන

07. **පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ සහතිකය**

මෙම අයදුම්පත භාරගන්නා අවසාන දිනයට පෙර මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

..............................
දිනය .......................................... නම සහ අත්සන

08. **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

...........................................................................................මිය/මෙනෙවිය* ..................................................නිලධාරිණියක වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත්, විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වරට / නොවන* බවටද .රු..............ක් වටිනා මුද්දර මෙම අයදුම්පත්‍රයට අලවා ඇති බවද / මුද්දර ඇලවීමට අනවශ්‍ය බවටද* අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි. මා ඉදිරිපිටදී අත්සන් කළ බවද සහතික කරමි.

..................................
දිනය :- .................................... ආයතන ප්‍රධානියාගේ අත්සන
[රබර් මුද්‍රාව තැබිය යුතුය]

09. **විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය**

**..................................................** මහත්මිය / මෙනෙවිය, පවුල් සෞඛ්‍ය සේවාවේ II "අ" ඛණ්ඩයේ / 11 ශ්‍රේණිය පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියක වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය ......................... ............................................
විමධ්‍යගත කොට්ඨාස / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන

(* අනවශ්‍ය කොටස් කපා හරින්න.) (රබර් මුද්‍රාව තැබිය යුතුය)